# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1763/25 - 2012 ජූනි මස 22 වැනි සිකුරාදා - 2012.06.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී — බී. 277/40.

**පුරාවස්තු ආඥාපනත (188 වන අධිකාරය)**

පුරාවස්තු ආඥා පනතේ (188 වැනි අධිකාරය වූ) 46 වන වගන්තිය සමග කියවිය යුතු 47 වන වගන්තිය යටතේ ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

ආචාර්ය ජගත් බාලසූරිය,
ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍ය,

2012 ජූනි මස 20 වැනි දින,
ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය,
08 වැනි මහල, "සෙත්සිරිපාය",
බත්තරමුල්ල.

නියෝග

1. මෙම නියෝග 2012 අංක ........... දරන පුරාවස්තු තෑගි අරමුදල යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. පුරාවස්තු තෑගි අරමුදල (මෙහි මින්මතු ,අරමුදල, යනුවෙන් හඳුන්වනු ලබන) පහත සඳහන් කාර්ය සඳහා ප්‍රයෝජනයට ගනු ලැබිය යුතුය.

(අ) පුරාවස්තු ආරක්ෂා කරගැනීමට දායකවන පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට, තොරතුරු සපයන්නන්ට, පොලිස් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට හා අනෙකුත් රාජ්‍ය ආයතනවල නිලධාරීන්ට ත්‍යාග මුදල් ගෙවීම සඳහා ;

(ආ) පුරාවස්තු විනාශවීම වැළැක්වීම සම්බන්ධයෙන් පුහුණු වැඩසටහන් පැවැත්වීම හා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ;

(ඇ) වර්ෂයකට රුපියල් ලක්ෂයක සීමාවකට යටත්ව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ කාර්යය මණ්ඩලයේ ක්‍රීඩා, විනෝද සහ සුබසාධක ක්‍රියාකාරකම් උදෙසා මුදල් සැපයීම ;

(ඈ) ප්‍රශංසනීය, නිර්භීත හෝ විශේෂ පිළිගැනීමක් හෝ ඇගයීමක් කලයුතු වෙනත් ක්‍රියාවලට ප්‍රදාන වශයෙන් මුදල් ගෙවීම ;

(ඉ) හදිසි අත්‍යවශ්‍ය සංරක්ෂණ කටයුත්තක් සඳහා හෝ අවස්ථාවෝචිත පරිදි පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අභිමතය පරිදි නියම කරනු ලබන යම් කටයුත්තක් සඳහා ;

සහ

(ඊ) අත්‍යවශ්‍ය පුරාවස්තු මිලදී ගැනීම හා සම්බන්ධව මුදල් ගෙවීම සඳහා.

3. අරමුදලෙන් සිදුකරනු ලබන ගෙවීම්වලට පහත ගෙවීම් ඇතුළත් විය යුතුය : -

(අ) අරමුදලේ සියලු ලැබීම් වලින් සියයට අනූහතක ප්‍රතිශතයක් මූලිකවම පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ හා අනෙකුත් රජයේ නිලධාරීන්ට ගෙවීම සඳහා ප්‍රයෝජනයට ගත යුතුය.

(ආ) අරමුදලේ ප්‍රයෝජනය සඳහා සහ අරමුදල ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය අදාල ගෙවීම් කිරීම සඳහා අරමුදලේ සියලු ලැබීම් වලින් ඉතිරි සියයට තුනක ප්‍රතිශතයෙන්, වර්ෂයකට රුපියල් ලක්ෂ පහක උපරිමයකට යටත්ව රුපියල් ලක්ෂයක් නොඉක්මවනු ලබන මුදලක් මෙම රෙගුලාසිවල 2(ආ) සිට (ඊ) දක්වා ඇති එක් එක් කාර්යය සඳහා මෙම අරමුදලෙන් ගෙවීමට පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයාට අවසර දිය හැකිය.

එසේ වුවද, රුපියල් ලක්ෂයකට වඩා වැඩි මුදලක් ගෙවීම ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශ ලේකම්ගේ ලිඛිත අවසරය ඇතිව සිදුකල හැකිය.

4. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට, අනෙකුත් ආයතනවල නිලධාරීන්ට හා අනෙකුත් පුද්ගලයන් සඳහා මුදල් බෙදා වෙන් කිරීම මෙහි 1 වන උපලේඛනයෙහි දක්වා ඇති පරිදි විය යුතුය.

5. අරමුදල යටතේ තෑගි ලැබීම සඳහා සුදුසුකම් ලබන ඕනෑම තැනැත්තකු විසින් මෙහි 11 වන උපලේඛනයෙහි දක්වා ඇති ආකෘති පත්‍රය පරිදි පුරා විද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත අයදුම්පතක් ඉදිරිපත් කළ යුතුය.

6. මෙම නියෝග ක්‍රියාත්මක කිරීමේ වගකීම පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත පවරනු ලැබිය යුතුය.

7. මෙම නියෝගවල විධිවිධාන 2010 ජනවාරි 01 වන දින සිට බලාත්මක වන බවට සලකනු ලැබිය යුතුය.

8. 2010 මැයි 07 වන දින, අංක 1653 දරන ගැසට් පත්‍රයෙහි සහ 2011 නොවැම්බර් 02 වන දින, අංක 1730/11 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි පලකරන ලද 2010 අංක 01 දරන පුරාවිද්‍යා තෑගි අරමුදල නියෝග ඒ යටතේ සිදුකරනු ලැබූ යම් ක්‍රියාවකට අගතියක් නොමැතිව මෙයින් පරිච්චින්න කරනු ලැබේ.

### I උපලේඛනය

(නියෝග 4)

ත්‍යාග වශයෙන් මුදල් බෙදාදීම පහත ආකාරයෙන් සිදුවිය යුතුය.

| *I වන තීරුව* | *II තීරුව* | |
|---|---|---|
| (i) | ශ්‍රී ලංකා පුරාවිද්‍යා ආඥාපනතේ නියමයන්ට පටහැනිව යම් පුරාවස්තුවක් අපනයනය කිරීම අනාවරනය කරන්නාවූ පොලිස් දෙපාර්තමේන්තුවේ යම් නිලධාරියකු හෝ ශ්‍රී ලංකා රේගුවේ යම් නිලධාරියෙකු හෝ අනෙකුත් ආයතනයක නිලධාරියෙකුට. | 30% |
| (ii) | පුරාවස්තු ආරක්ෂාව සඳහා අදාළ තොරතුරු සපයන පුද්ගලයෙකුට | 10% |
| (iii) | මාණ්ඩලික ශ්‍රේණියේ නිලධරයකුගේ තරාතිරමට පහලින් නඩු කටයුතුවලට අදාළ ස්ථාන පරීක්ෂා කිරීමට සහභාගී වන ගවේශන නිලධාරියෙකුට හෝ පුරාවිද්‍යා පර්යේෂණ සහකාර නිලධාරියෙකුට හෝ පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් බලය පවරනු ලැබූ වෙනත් නිලධාරියෙකුට. | 12% |
| (iv) | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නඩු කටයුතුවලට සහභාගී වන නීති නිලධාරීන්ට හෝ සහකාර නීති නිලධාරියෙකුට හෝ රජයේ නීතිඥවරයෙකුට | 9% |

| *I වන තීරුව* | *II තීරුව* | |
|---|---|---|
| (v) | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නඩු කටයුතුවලට සහභාගී වන පළාත් ප්‍රධානීන්ට | 7% |
| (vi) | නඩු කටයුතුවලට අදාළ ස්ථාන පරික්ෂා කිරීමට සහභාගී වන මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකුට | 6% |
| (vii) | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ පුරාවිද්‍යා අධ්‍යක්ෂ-ජනරාල්වරයාට හෝ ඔහු වෙනුවට බලය පවරනු ලැබූ වෙනත් නිලධාරියෙකුට | 5% |
| (viii) | නඩු කටයුතුවලට අදාළ වාර්තා සකස්කිරීම සහ ඒවා පවත්වාගෙන යනු ලබන පුරාවිද්‍යා විනාශය වැළැක්වීමේ ඒකකයේ යම් නිලධාරියෙකුට | 5% |
| (ix) | පුරාවිද්‍යා තැගි අරමුදල පරිපාලනය කිරීමේ හා නඩත්තු කටයුතු පවත්වාගෙන යනු ලබන ගිණුම් අංශයේ යම් නිලධාරියෙකුට හෝ සහකාර නිලධාරියෙකුට | 4% |
| (x) | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ගවේශන අංශයේ අධ්‍යක්ෂවරයාට, සහකාර අධ්‍යක්ෂවරයාට හෝ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයාට | 3% |
| (xi) | පුරාවිද්‍යා තැගි අරමුදල පරිපාලනය කිරීමේ හා නඩත්තු කටයුතු පවත්වාගෙන යනු ලබන පරිපාලන අංශයේ යම් නිලධාරියෙකුට සහ හෝ නිලධාරීන්ට | 3% |
| (xii) | නඩු කටයුතුවලට අදාළ ස්ථාන හෝ පුරාවස්තු පරික්ෂා කිරීමට සහභාගිවන හෝ සහාය දක්වන ගවේෂණ සහකාර තනතුරේ සිටින්නෙකුට | 2% |
| (xiii) | අධිකරණ කටයුතුවලට සහභාගී වන රියදුරන්ට හෝ අනෙකුත් සේවකයන්ට | 4% |

(නියෝග 5)

II වන උපලේඛනය

පුරාවිද්‍යා තැගි අරමුදල යටතේ ප්‍රදානයන් ලබාගැනීමට සුදුසුකම් ලබන්නන් විසින් සම්පූර්ණ කලයුතු අයදුම් පත්‍රය.

(1) ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම : ......................................................................................

(2) ලිපිනය : ..........................................................................

පෞද්ගලික : ..........................................................................

රාජකාරි : ..........................................................................

(3) ජාතික හැඳුනුම්පත් අංකය : ......................................................................................

(4) දෙපාර්තමේන්තුව : ..........................................................................

(5) තනතුර : ..........................................................................

(6) නඩු අංකය : ..........................................................................

(7) අධිකරණයේ නම : ..........................................................................

(8) තැගි අරමුදලට බැරකල ප්‍රමාණය : ......................................................................................

(9) තැගි අරමුදලට බැරකල දිනය : ......................................................................................

(10) ඉටු කරන ලද රාජකාරිය : ......................................................................................

..................................................................................................................(අයදුම්කරුගේ නම) වන මා ඉහත සඳහන් තොරතුරු මාගේ දැනීමේ හැටියට සත්‍ය නිවැරදි බවට ප්‍රකාශ කර සිටින අතර, අසත්‍ය තොරුතුරු සපයන ලද බවට අනාවරණය වුවහොත් පුරාවිද්‍යා තැගි අරමුදල යටතේ ප්‍රදානයන් ලබාගැනීමට නුසුදුස්සෙකු බවද හොඳාකාරවම දන්නා බවද ප්‍රකාශ කර සිටිමි.

ප්‍රදානය ලබන්නාගේ අත්සන

දිනය :

පළාත් නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂවරයාගේ නිර්දේශය
..................................................................................................................
.....................................................................................................................................................................................

දිනය : අත්සන

අධ්‍යක්ෂ ජනරාල්වරයා/බලයලත් නිලධාරියාගේ නියෝගය :
.....................................................................................................................................................................................
.....................................................................................................................................................................................

දිනය : අත්සන

07 - 235

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.